 

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப்) பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

නැටුම් (භරත) I
நாட்டியம் (பரதம்) I
Dancing (Baratha) I

**53 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* පිළිතුරු පත්‍රයේ පසුපිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය, **පිළිතුරු පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** කෞතුව ගීතයේ 'වාමන රූපා' යැයි සඳහන් කරන දෙවියා,
(1) මුරුගන් ය. (2) ගණපති ය. (3) සිව ය. (4) පාර්වතී ය. (5) බ්‍රහ්මා ය.

**2.** ගීත ගෝවින්ද ගායනාවලට නටන නිරුත්තිය උරුප්පඩි
(1) ජාවලි ය. (2) අලාරිප්පු ය. (3) අෂ්ඨපති ය. (4) තිල්ලානා ය. (5) ශබ්දම් ය.

**3.** නාට්‍ය ශාස්ත්‍රයේ දෙවන පරිච්ඡේදය ලෙස සඳහන් වන්නේ,
(1) අරංගම් ය. (2) රසය ය. (3) අභිනය ය. (4) විරුත්ති ය. (5) කරණම් ය.

**4.** මිශ්‍රජාති ජම්බයිතාලම්, සංකීර්ණ කති ලෙස වෙනස් වන විට ගන්නා සංඛ්‍යාව,
(1) 30 කි. (2) 40 කි. (3) 50 කි. (4) 70 කි. (5) 90 කි.

**5.** 'තිරුමයිලයි කුරවංචි' යන නර්තන නාට්‍යය ලියූ ලාංකීය නර්තනාචාර්යවරයා,
(1) ඒරම්බු සුප්පයියා ය.
(2) බ්‍රහ්ම ශ්‍රී වීරමණි අයියර් ය.
(3) රාජනායගම් ය.
(4) ගීතාංජලි නල්ලයියා ය.
(5) කයිලාය පිල්ලයි ය.

**6.** ආභරණ සියල්ල රිදියෙන් හෝ රිදී වර්ණයෙන් පැළඳ නටන ශාස්ත්‍රීය නර්තනය,
(1) ඔඩිසී වේ.
(2) භරත නර්තනය වේ.
(3) කුච්චිපුඩි වේ.
(4) මෝහිණියාට්ටම් වේ.
(5) කථකලි වේ.

**7.** සිව දෙවියන් පංච කිරුත්තියංගල් කිරීම සඳහා ගත් රූපය,
(1) තෙට්චනා මූර්ති රූපය වේ.
(2) සෝමස්කන්ධ රූපය වේ.
(3) නඩරාජ රූපය වේ.
(4) අර්ථ නාරීස්වර රූපය වේ.
(5) ලිංගෝට්පව රූපය වේ.

**8.** ආරම්භයේ මහත්ව ද පසුව කුඩාවට ද අවසානයේ මහත්ව ද දක්නට ලැබෙන ජති ව්‍යුහය,
(1) මිරුතංග ජතිය වේ.
(2) ස්රෝතෝවහ ජතිය වේ.
(3) කෝපුච්ච ජතිය වේ.
(4) ඩමරුක ජතිය වේ.
(5) විෂම ජතිය වේ.

**9.** මෝහිණියාට්ටම් නැටුම් ක්‍රමය නිර්මාණය කිරීමට මූලික වූයේ,
(1) රාජ රාජ සෝලන් ය.
(2) තංජයි නාල්වර් ය.
(3) ශ්‍රීමති රුක්මණි අරුන්ඩේල් ය.
(4) ආචාර්ය ස්වාමිනාද අයියර් ය.
(5) ස්වාදිත් තිරුනාල් මහාරාජා ය.

**10.** අනෙකුත් ශාස්ත්‍රීය නර්තනවලට වඩා කුච්චිපුඩි නර්තනයේ සුවිශේෂ ලක්ෂණයක් වනුයේ,
(1) නර්තකියගේ සැරසිලි අතිශයෝක්තියෙන් කර තිබීම ය.
(2) නර්තකියගේ භාවය වැඩි කර දැක්වීම ය.
(3) නර්තකිය ගයමින් නැටීම ය.
(4) නර්තකිය වාද්‍ය භාණ්ඩ වයමින් නැටීම ය.
(5) නර්තකියගේ ශරීරාංග චලන අතිශයෝක්තියෙන් කර දැක්වීම ය.

[ දෙවැනි පිටුව බලන්න.

**11.** 'තෙයි තෙයි දිතිතෙයි' යන අඩව්ව කරන පාද භේදය,
(1) ලුඩ්ඩම් ලෝලිදම් ය. (2) කුට්ටණම් ය. (3) තදත්පරම් ය.
(4) වෙගිණි ය. (5) සරණම් ය.

**12.** ශ්‍රීමති රුක්මණී අරුණ්ඩේල්ගේ පළමුවැනි භරත නාට්‍ය ගුරුවරයා
(1) ගෞරි අම්මාල් ය. (2) මීනාට්සි සුන්දරම් පිල්ලයි ය.
(3) රාමයියා පිල්ලයි ය. (4) බාලසරස්වති අම්මාල් ය.
(5) ජීවරත්තිනම් රාජලට්සුමි ය.

**13.** 'සංකීර්ණ ජාති' යන විරුදාවලිය ලත් රජතුමා,
(1) අනභායන් ය. (2) නායක්ක රජු ය.
(3) දෙවැනි පරමේශ්වරන් ය. (4) මහේන්ද්‍ර වර්මන් ය.
(5) කුලෝත්තුංග රජු ය.

**14.** පිණ්ඩි, පිනෛයල් ආදී හස්ත චලන ගැන කියැවෙන ග්‍රන්ථය,
(1) අභිනයතර්පණම් ය. (2) නාට්‍ය ශාස්ත්‍රම් ය.
(3) සිලප්පදිගාරම් ය. (4) නාට්‍ය කලාව ය.
(5) භරත කලාව ය.

**15.** ත්‍රිකාල තීර්මානම්වල පිළිවෙළ වනුයේ,
(1) විලම්බම්, මත්තිමම් හා තුරිදම් ය. (2) මත්තිමම්, තුරිදම් හා විලම්බම් ය.
(3) තුරිදම්, විලම්බම් හා මත්තිමම් ය. (4) මත්තිමම්, විලම්බම් හා තුරිදම් ය.
(5) විලම්බම්, තුරිදම් හා මත්තිමම් ය.

**16.** ආකාර පහේ ගෞත්තුවම් මුලින් ම නටන ලද්දේ කුමන කාල වකවානුවක දී ද?
(1) පල්ලවර් කාලයේ දී (2) චෝල කාලයේ දී
(3) සංග කාලයේ දී (4) සංග මරුවිය කාලයේ දී
(5) නායක්කර් කාලයේ දී

**17.** ශාන්ති කුත්තුවල පළමු කොටස ලෙස සලකනුයේ,
(1) සොක්කම් ය. (2) අගමාර්ක්කම් ය. (3) අභිනය කුත්තු ය.
(4) ආරියක් කුත්තු ය. (5) විනෝද කුත්තු ය.

**18.** ශ්‍රී ක්‍රිෂ්ණන් අයත් වන්නේ කුමන වර්ගයට ද?
(1) තීරසාන්දන් (2) තීරෝත්තදන් (3) තීරෝතාත්තන්
(4) වෛසිගන් (5) තීරලලිතන්

**19.** නායක නායිකාවන් එකමුතු කිරීමෙහි වඩාත් දක්ෂ වනුයේ,
(1) දාසි ය. (2) සකි ය. (3) සේඩි ය. (4) තාත්රේයි ය. (5) ඉලිංගිණි ය.

**20.** හැඟීමක් ඇතිවීමට හේතු වනුයේ,
(1) විභාවම් ය. (2) භාවම් ය. (3) අනුභාවම් ය.
(4) වියප්පිච්චාරි භාවම් ය. (5) නිජකාර්යාභිනයම් ය.

**21.** භරත නාට්‍යය නර්තන ආකාරයට පත්වූයේ කුමන සම්ප්‍රදාය මගින් ද?
(1) කුරවංචි (2) යක්ෂගානම් (3) සතිර්
(4) භාගවදමේලම් (5) නර්තන නාට්‍යය

**22.** චෝල යුගයේ දී නර්තන ශිල්පීන්ට කෝවිල්වල වෙන් කළ මණ්ඩපය වූයේ,
(1) වට්ටක්කලරි ය. (2) වේදිකාව ය. (3) අරංගය ය.
(4) ඌර්දි වේදිකාව ය. (5) තිරුචෝලක්ක මණ්ඩපය ය.

**23.** කවිමණි තේසිග විනායගම් පිල්ලයි ගෙතූ පදම් කුමක් ද?
(1) කුයිලේ උනකනන්ද කෝඩි නමස්කාරම්.........
(2) කන්නන්නිඩම් එඩුත්තු චොල්ලඩී.........
(3) අලෛත්තු වා පෝඩි.........
(4) තයියලේ උන්නයි නිනෛනෙන්දු.........
(5) නල්ල සගුනම් නෝක්කි චොල්ලඩී.........



Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

**24.** තිල්ලානා යන උරුප්පඩියෙහි,
(1) පල්ලවියේ සාහිත්‍යයම් පිහිටයි. (2) අනුපල්ලවියේ සාහිත්‍යයම් පිහිටයි.
(3) සරණම්වල සාහිත්‍යය පිහිටයි. (4) පල්ලවියේ හා අනුපල්ලවියේ සාහිත්‍යය පිහිටයි.
(5) අනුපල්ලවිය හා සරණම්වල සාහිත්‍යය පිහිටයි.

**25.** ශෘංගාර රසයට පමණක් ප්‍රධානත්වය දෙන උරුප්පඩිය,
(1) ශෞත්තුවම් ය. (2) අෂ්ටපති ය. (3) කීර්ත්තනම් ය. (4) ශබ්දම් ය. (5) ජාවලි ය.

**26.** මංගල හා අවමංගල අවස්ථාවල වාදනය කරන භාණ්ඩ,
(1) සේමක්කලම් හා හක්ගෙඩිය ය. (2) පරයි හා ඩෝල්කි ය.
(3) තප්පට්ටයි හා හක්ගෙඩිය ය. (4) නාදස්වරම් හා තවිල් ය.
(5) උඩැක්කිය හා මිරුතංගම් ය.

**27.** සංග කාලයේ කණික්කාරි, සාලිණි හා දේවරාට්ටි යන නම්වලින් හඳුන්වනු ලැබූයේ,
(1) ගායනා කරන කාන්තාවන් ය. (2) වාදනය කරන්නන් ය.
(3) කුරවයි නටන කාන්තාවන් ය. (4) වෙරියාඩුම් කාන්තාවන් ය.
(5) තුණංගයියාඩුම් කාන්තාවන් ය.

**28.** සිව දෙවියන්ගේ ඇස් තුනෙන් අදහස් වන්නේ,
(1) ආණවම්, කන්මම් හා මායයි ය. (2) ඉච්චා ශක්තිය, කිරියා ශක්තිය හා ඥානා ශක්තිය ය.
(3) පාසම්, අංගුසම් හා මලු ය. (4) පති, පසු හා පාසම් ය.
(5) ආරණි, සෙනනි හා කෝයයිත්තිරි ය.

**29.** "මන්රල්වරුඥ් චේනයි තනයි කණ්ඩු පයන්දාල් - ඉන්ද මයියලුම් කිරුකිරුප්පුම් කයියලර්ක්කුණ්ඩෝ..." යැයි තිරුක්කුට්ටල කුරවංචිවල කවුරුන් විසින් ගායනය කරනු ලැබුවේ ද?
(1) කුරවන් (2) කුරත්ති (3) කට්ටියකාරන් (4) වසන්තවල්ලි (5) යෙහෙළිය

**30.** භරත නාට්‍යයේ ලස්සන කාන්තාවකගේ රූපය දැක්වීමට අභිනය කරනුයේ,
(1) අර්ධසූසි අල්ලා S මෙන් නවා පෙන්වීම මගිනි.
(2) සර්ප සීර්සම් අල්ලා S මෙන් නවා පෙන්වීම මගිනි.
(3) මිරුග සීර්සම් අල්ලා S මෙන් නවා පෙන්වීම මගිනි.
(4) කපිත්තම් අල්ලා S මෙන් නවා පෙන්වීම මගිනි.
(5) කම්සාස්යම් අල්ලා S මෙන් නවා පෙන්වීම මගිනි.

**31.** තට්ටු මෙට්ටු අඩවු දක්වන පාද අවස්ථාව,
(1) ස්ථානකම් ය. (2) ආයතම් ය. (3) ආලිඩම් ය. (4) බ්‍රම්මරි ය. (5) බ්‍රෙංගණම් ය.

**32.** ත්‍රු කුඩු තක තක = ත්‍රුකුඩුතක ත්‍රුකුඩුතක // යන තත්තක්කාර හඬ එන්නේ,
(1) තිස්ර අලාරිප්පුවල ය. (2) සතුස්ර අලාරිප්පුවල ය.
(3) කණ්ඩ අලාරිප්පුවල ය. (4) මිශ්‍ර අලාරිප්පුවල ය.
(5) සංකීර්ණ අලාරිප්පුවල ය.

**33.** "පඩුක්කයි නොන්ද්දඩි පාලුම් කසන්දතඩි......" මෙම ගීතයෙන් හඟවන නායිකාව
(1) කලකාන්දරිදා ය. (2) වාසකසජ්ජිගා ය. (3) විරහෝත් කණ්ඩිදා
(4) කණ්ඩිදා ය. (5) ස්වාධීනපදිගා ය.

**34.** උපාංගම් යන කොටසේ අඩංගු වනුයේ,
(1) බාහු, කොන්ද, බඩ හා කලවා ය. (2) හිස, අත්, ඉන හා පාද
(3) හිස, බඩ, ඉන හා කොන්ද ය. (4) ඇස්, නාසය, කොපුල හා තොල් ය.
(5) නාසය, හිස, අත් හා දිව ය.

**35.** ;; ;; ;; ;;/, තදිං කිණතොම් තදිං/කිණතොම් තදිං කිණතොම්//
ඉහත පංච ජාති තදිං කිණතොම් සංකේතයෙන් ලිවිය යුත්තේ,
(1) තකදිමි තකදිමි තකදිමි තකදිමි ත ලෙසිනි.
(2) තකිට තකිට තකිට තකිට ත ලෙසිනි.
(3) තකතකිට තකතකිට තකතකිට තකතකිට ත ලෙසිනි.
(4) තකදිමි තකිට තකදිමි තකිට ත ලෙසිනි.
(5) තකදිමි තකදිමි තකිට තකිට ත ලෙසිනි.

**36.** කථකලි නර්තනයේ දී රාවණා දැක්වීමට යොදා ගන්නා වේෂය කුමක් ද?
(1) යට් රවුල (2) මිනුක්කු (3) කරි (කළු)
(4) වෙල්ලයි (සුදු) (5) කත්ති



Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

**37.** වර්ණවත් වෙස් මුහුණු පැළඳ නටන නර්තනය,
(1) කෝලම් ය. (2) සොකරි ය. (3) මඩු ය. (4) උඩැක්කි ය. (5) නයියාණ්ඩි ය.

**38.** වාත්සායනර් විසින් ගොනු කර පවසන ලද්දේ,
(1) පංචමහා කාප්පියම් ය. (2) කොන්රයි වේන්දන් ය. (3) තිරුමන්දිරම් ය.
(4) පාමාලයි ය. (5) හැටහතර කලා ය.

**39.** දෙවියන් වදිමින් පිං ලබා ගැනීම උදෙසා නටන සබරගමුවේ නර්තන සම්ප්‍රදාය,
(1) යාදිනි මාත්‍රය ය. (2) යක්පත මාත්‍රය ය. (3) පට්ටුතල් මාත්‍රය ය.
(4) සින්දු මාත්‍රය ය. (5) මුල් මාත්‍රය ය.

**40.** කෝවිල් වන්දනාවේ දී 'නිරුත්තියෝපසාරම්' ලෙස හඳුන්වනුයේ,
(1) දීපාරාදනය ය. (2) පණ්ණෝඩු ගායනා කිරීම ය. (3) නර්තනය ය.
(4) ස්වාමි පිටත් වීම ය. (5) නාදස්වරම් වාදනය ය.

**41.** කූත්තු සිද්ධියට භාවිත කරන සම් භාණ්ඩය,
(1) මිරුතංගම් ය. (2) තවිල් ය. (3) සෙණ්ඩයි ය. (4) ඩෝල්කිය ය. (5) මද්දලය ය.

**42.** නඩරාජ දර්ශණයේ දී 'ඕම් කාරයෙන්' හඟවන්නේ,
(1) ඌන්ඩ්‍රිය තිරුවඩි ය. (2) තූක්කිය තිරුවඩි ය. (3) තිරුවාසි ය.
(4) අභයකරම් ය. (5) වරදකරම් ය.

**43.** ඉන්දීය ජනයා තම සම්ප්‍රදායවලින් ඉවත් ව ගිය කාලය,
(1) ගුප්ත කාලයයි. (2) චෝල කාලයයි.
(3) මරාට්වරුන්ගේ කාලයයි. (4) ඉංග්‍රීසීන්ගේ කාලයයි.
(5) නායක්කර් කාලයයි.

**44.** උතුරු භාෂාවෙන් භරතමුනි ලියූ නාට්‍ය ශාස්ත්‍රය දෙමළ බසට පරිවර්තනය කළේ,
(1) එස්.එන්. ශ්‍රීරාම තේසිගන් ය. (2) වීරමා මුනිවර් ය.
(3) කනම් ක්‍රිෂ්ණයියර් ය. (4) මුත්තුස්වාමි තිට්ෂිදර් ය.
(5) වලුවූර් රාමයියා පිල්ලයි ය.

**45.** 'සතුර් තණ්ඩි ප්‍රකාශිකා' යන ග්‍රන්ථය ලියුවේ,
(1) රගු නාද නායක්කර් ය. (2) පාණ්ඩිය රජු ය.
(3) විජයරාගව නායක්කර් ය. (4) සගජි රජු ය.
(5) සරබෝජි රජු ය.

**46.** 'මෙයිතික්කල්' ජනයා විසින් නටන ලද ශාස්ත්‍රීය නර්තනය,
(1) කථකලි ය. (2) කුච්චිපුඩි ය. (3) මණිපුරි ය. (4) කථක් ය. (5) ඔඩිසි ය.

**47.** බරණ ගණිත නම් පුද්ගලයාට කුෂ්ඨ රෝගයෙන් නිදහස් වීම සඳහා ගායනා කරන ලද කාව්‍යය,
(1) ගෞත්තුවම් ය. (2) කීර්තනම් ය.
(3) ජාවලි ය. (4) තිරුප්පුහල් ය.
(5) සින්දු වන්නම් ය.

**48.** කෝවිල්වල විශේෂ දිනවල නටන 'දති (Dadhi)' නම් පුණ්‍යවන්ත නර්තනය සිදු වන නර්තන වර්ගය,
(1) මණිපුරි ය. (2) කථක් ය. (3) කථකලි ය.
(4) මෝහිණි නැටුම් ය. (5) භරත ය.

**49.** යාපනයේ වෛතීස්වරා විද්‍යාලීය ශාලාවේ දී 'නර්තනය' ගැන දේශන පැවැත් වූ ඉන්දීය කලාකරුවා,
(1) පොන්නයියා පිල්ලෙයි ය. (2) ඊ. ක්‍රිෂ්ණයියර් ය.
(3) වලුවූර් රාමයියා පිල්ලයි ය. (4) පන්දනෛයි නල්ලූර් මීනාච්සි සුන්දරම් පිල්ලයි ය.
(5) අඩයාර් ලක්ෂ්මණන් ය.

**50.** නර්තන කලාව පිළිබඳ 'ප්‍රථම කලා උපාධිය' ලබා දෙන ආයතනය,
(1) රාමනාදන් ලලිත කලායතනයයි. (2) ස්වාමි විපුලානන්දා අධ්‍යාපන ආයතනයයි.
(3) උත්තර ලංකා සංගීත සභාවයි. (4) තිරුමරයි කලා ආයතනයයි.
(5) ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයයි.

* * *

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

| | | |
|---|---|---|
| නැටුම් (භරත) II<br>நாட்டியம் (பரதம்) II<br>Dancing (Baratha) II | 53 S II | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

**උපදෙස්:**

✻ **I** කොටසේ **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **දෙකක්** ද **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) පද වර්ණයේ ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04යි.)

(ii) ඔබ උගත් පද වර්ණයක රාගය හා තාලය සඳහන් කර, එහි අනු පල්ලවි කොටසට අයත් තීර්මාණම් එකක් තාල අංග සංකේත සමග ලියන්න. (ලකුණු 10යි.)

(iii) එම පද වර්ණයේ පළමුවන සරණ ස්වර කෝර්වයි, තාල අංග සංකේත සමග ලියන්න. (ලකුණු 06යි.)

**2.** සෙන්ඩයි භාණ්ඩය වාද්‍ය භාණ්ඩයක් ලෙස ගන්නා ශාස්ත්‍රීය නර්තනයක් පහත අංග සලකා පැහැදිලි කරන්න.

(i) සාහිත්‍ය සැකැස්ම (ගීතය) (ලකුණු 03යි.)

(ii) ශරීරාංග චලන (ලකුණු 05යි.)

(iii) රස ප්‍රකාශනය (ලකුණු 05යි.)

(iv) සැරසිලි (ලකුණු 07යි.)

**3.** තාල දස ප්‍රාණන්ගල් ගැන පැහැදිලි කරන්න. (ලකුණු 20යි.)

## II කොටස

**4.** භරත නාට්‍ය වේදිකා සැකැස්ම ගැන පහත කරුණු පදනම් කරගෙන පහදන්න.

(i) වේදිකාව

(ii) ආලෝකය

(iii) හඬ

(iv) දර්ශන

(ලකුණු 05 × 4 = 20යි.)

**5.** කෙටි සටහන් ලියන්න.

(i) කුදිරෛ ආට්ටම්

(ii) කොහොඹා කංකාරිය

(iii) සාත්වික අභිනය

(iv) මුග වීණාව

(ලකුණු 05 × 4 = 20යි.)

**6.** ගුරු ඊ. ක්‍රිෂ්ණයියර් භරත නාට්‍යයේ පුනරුදය සඳහා ඉටු කළ සේවාව ගැන ලියන්න. (ලකුණු 20යි.)

**7.** ශ්‍රී ලංකාවේ කලා සංවර්ධනය සිදු කරන රජයේ ලලිත කලා ආයතනයක් වන රාමනාදන් ලලිත කලා ආයතනයේ බිහිවීම, වර්ධනය හා නර්තන කලාවට එයින් ලැබුණු දායකත්වය ගැන පැහැදිලි කරන්න. (ලකුණු 20යි.)

**8.** වර්තමාන නර්තන නාට්‍යවල සාර්ථක අසාර්ථක බව උදාහරණ සහිත ව විවේචනය කරන්න. (ලකුණු 20යි.)

✻✻✻

Department of Examinations, Sri Lanka